# බස්නාහිර පළාත් සභාව

# පළාත් ඉංජිනේරු කාර්යාංශය

## <u>ඉදිකිරීම් වැඩ, ද්‍රව්‍ය හා සේවා සැපයුම්කරුවන්, උපදේශන සේවා සපයන්නන් සහ සුළු පරිමාණ කොන්ත්‍රාත්කරුවන් ලියාපදිංචි කිරීම - 2022/2023</u>

බස්නාහිර පළාත් ඉංජිනේරු කාර්යාංශයේ ප්‍රධාන කාර්යාලය හා ප්‍රාදේශීය ඉංජිනේරු කාර්යාල මඟින් ක්‍රියාත්මක කරනු ලබන ඉදිකිරීම් ව්‍යාපෘතීන් වලට අදාල " ඉදිකිරීම් වැඩ සඳහා කොන්ත්‍රාත්කරුවන් , සේවා සැපයුම්කරුවන්, උපදේශන සේවා සපයන්නන් සහ සුළු පරිමාණ කොන්ත්‍රාත්කරුවන් " වශයෙන් ලියා පදිංචි වීමට අපේක්ෂා කරනු ලබන ඉදිකිරීම් ආයතන හා පුද්ගලයින්, උපදේශන සේවා සපයන්නන්, සහ සුළු පරිමාණ කොන්ත්‍රාත්කරුවන් වෙත 2022/2023 වර්ෂය සඳහා ලියාපදිංචි වීමට මෙයින් ආරාධනා කරනු ලැබේ.

ඒ අනුව පහත සඳහන් එක් එක් කාණ්ඩ සඳහා 2022/2023 වර්ෂයට ලියාපදිංචි කිරීම කරනු ලැබේ.

**A - කාණ්ඩය - <u>ඉදිකිරීම් "වැඩ" සඳහා කොන්ත්‍රාත්කරුවන් ලියා පදිංචි කිරීම.</u>**

B - කාණ්ඩය - **<u>ද්‍රව්‍ය හා සේවා සැපයුම්කරුවන්, උපදේශන සේවා සපයන්නන්, සුළු පරිමාණ කොන්ත්‍රාත්කරුවන් ලියාපදිංචි කිරීම</u>**

**B කාණ්ඩය පහත සඳහන් අනු කාණ්ඩ යටතේ කාණ්ඩ ගත කර ඇත.**

BA - තාක්ෂණික උපදේශන සේවා සපයන්නන් හා ආයතන

BB - සුළු පරිමාණ කොන්ත්‍රාත්කරුවන්

BC - සේවා සැපයුම්කරුවන්

<u>BA- තාක්ෂණික උපදේශන සේවා සපයන්නන් හා ආයතන</u>

| | | |
|---|---|---|
| **BA1** | ව්‍යුහමය ඉංජිනේරු සේවා | ගොඩනැගිලි නිර්මිත සේවා පිළිබඳ විශේෂඥතාව සහිත |
| **BA2** | වාස්තු විද්‍යාත්මක සේවා | ආයතනික ගොඩනැගිලි පිළිබඳ විශේෂඥතාව සහිත |
| **BA3** | වාස්තු විද්‍යාත්මක සේවා (අභ්‍යන්තර) | අභ්‍යන්තර ගෘහ අලංකරණ පිළිබඳ විශේෂඥතාව සහිත |
| **BA4** | වාස්තු විද්‍යාත්මක සේවා /භූමි අලංකරණය | භූමි අලංකරණය හා නඩත්තු සේවා පිළිබඳ විශේෂඥතාව සහිත |
| **BA5** | බලයලත් ඉඩම් මිනින්දෝරු සේවා | ඉඩම් මැනීම සඳහා සුදුසුකම් හා පලපුරුද්ද සහිත |
| **BA6** | ප්‍රමාණ සමීක්ෂක සේවා | ගොඩනැගිලි ප්‍රමාණ සමීක්ෂන සේවා පිළිබඳ විශේෂඥතාව සහිත |
| **BA7** | විදුලි ඉංජිනේරු සේවා | ගොඩනැගිලි විදුලි ඉංජිනේරු සේවා පිළිබඳ විශේෂඥතාව සහිත |
| **BA8** | යාන්ත්‍රික ඉංජිනේරු සේවා | ගොඩනැගිලි සඳහා හා මලාපවහන පිරිපහදු පිළිබඳ විශේෂඥතාව සහිත |
| **BA9** | යාන්ත්‍රික ඉංජිනේරු සේවා | ගොඩනැගිලි සේවා (විදුලි සෝපාන පද්ධති, වායුසමීකරණ පද්ධති, ගිනි ආරක්ෂණ පද්ධති ) |
| **BA10** | යාන්ත්‍රික ඉංජිනේරු සේවා | මෝටර් වාහන තාක්ෂණය පිළිබඳ විශේෂඥ සේවා |

| | | |
|---|---|---|
| **BA11** | වරලත් විදුලි ඉංජිනේරුවන් | විදුලි ස්ථාපනයන් සහතික කිරීම සඳහා ලංවිම සමඟ ලියාපදිංචි වී ඇති. |
| **BA**12 | භූ තාක්ෂණ විමර්ශන සේවා | විශේෂිත බිම් වැඩිදියුණු කිරීම, අත්තිවාරම් සැලසුම් සහ පාංශු පරීක්ෂණ විශේෂඥ සේවාවන් |
| **BA**13 | ප්‍රධාන සැලසුම් සකස් කිරීම (Master Plan) /උපදේශනය (Consultants) | බස්නාහිර පළාත් සභාවේ ආයතන සඳහා ප්‍රධාන සැලසුම් සකස් කිරීම (Master Plan) හා උපදේශන සේවා සැපයීම |

## BB - සුළු පරිමාණ කොන්ත්‍රාත්කරුවන් හෝ ආයතන

| | |
|---|---|
| **BB1** | දොර / ජනෙල් / හෝ බෙදා වෙන් කිරීමේ (පාටිෂන්) කාර්යයන් සඳහා ඇලුමිනියම් නිර්මාන සැකසීම් |
| **BB2** | ව්‍යුහාත්මක වානේ පිරිසැකසුම්කරුවන් (වානේ කාප්ප, වානේ ගොඩනැගිලි රාමු ආදිය) |
| **BB3** | ගෘහස්ථ සහ එළිමහන් උද්‍යාන වගාවන්, තණ පිඩලි ඇල්ලීම හා භූමි අලංකරණ කටයුතු |
| **BB4** | ගොඩනැගිලිවල බිත්ති සඳහා ලෝහ ආවරණ ස්ථාපනය කිරීම (wall cladding) |
| **BB5** | මල නොබදින වානේ සැකසීම් (Stainless steel fabricators) |
| **BB6** | බුමුතුරුණු සැපයීම සහ සවි කිරීම |
| **BB7** | ඩිජිටල් මුද්‍රණය සහ බැනර් සෑදීම, නාම පුවරු ආදිය ... |
| **BB8** | සුළු වැඩ සඳහා දැව සැපයීම් |
| **BB9** | ගොඩනැගිලි සංරචක අළුත්වැඩියාව සහ නඩත්තුව (වහල අලුත්වැඩියාව, තීන්ත ආලේප කිරීම, කපරාදු කිරීම, පින්තාරු කිරීම, බිම් සැකසීම, පෙදරේරු වැඩ, වැහි පීලි, දොරවල්, ජනේල) |
| **BB10** | මනු වල හා මළ මාර්ග ඇතුළුව ජලනල, ජලාපවහන හා වැහි ජල පද්ධති අළුත්වැඩියාව සහ නඩත්තුව |
| **BB11** | අඩු වෝල්ටීයතා විදුලි පද්ධති සහ උපකරණ අළුත්වැඩියාව සහ නඩත්තුව |
| **BB12** | split වර්ගයේ වායු සමීකරණ අළුත්වැඩියාව සහ නඩත්තුව |
| **BB13** | මලාපවහන සහ ජල පොම්ප අළුත්වැඩියාව සහ නඩත්තුව |
| **BB14** | දැව පොළව කපා මට්ටම් කිරීම, ඔප දැමීම සහ සීලන්ට් (Sealants) යෙදීම හා සිමෙන්ති තට්ටු යෙදීම |
| **BB15** | ගලි සේවය (පූතික ටැංකි, පෙහවුම් වලවල් පිරිසිදු කිරීම හා හිස් කිරීම) |
| **BB16** | බල උත්පාදක යන්ත්‍ර අලුත්වැඩියාවන් හා සේවා කිරීම |

## BC - සේවා සැපයුම්කරුවන්

| | |
|---|---|
| **BC1** | ජල මුද්‍රිත රසායනික සැපයුම්කරුවන් / ස්ථාපකයන් / ජල වාරක කොන්ත්‍රාත්කරුවන් (Water Proofing) |
| **BC2** | පළිබෝධ පාලන සේවා / වේයන් මර්ධන සේවා |
| **BC3** | කාර්යාල ගෘහභාණ්ඩ සැලසුම් කිරීම, සැපයීම සහ සවි කිරීම |
| **BC4** | තිර රෙදි සහ වැහි ආවරණ සැලසුම් කිරීම, සැපයීම සහ සවි කිරීම |
| **BC5** | ගිනි ආරක්ෂණ සහ නිවාරණ පද්ධති සැලසුම් කිරීම, සැපයීම හා සවි කිරීම |
| **BC6** | කොන්ක්‍රීට් අළුත්වැඩියා කටයුතු ; කොන්ක්‍රීට් නිර්මිතයන්හි පළුදු හා සන්ධි බදාම හෝ නික්ෂේපණ ක්‍රම යොදා යථාවත් කිරීම, මල කෑ වැරගැන්නුම් යථාවත් කිරීම ඇතුලත් වේ. |
| **BC7** | පරිගණක ග්‍රැෆික් / මෘදුකාංග භාවිතයෙන් ගොඩනැගිලිවල ත්‍රිමාණ ආකෘති (3D) නිර්මාණය |
| **BC8** | ආරක්ෂක සේවා සැපයුම් ආයතන |
| **BC9** | ඉන්ටර්ලොක් ගල් සැපයුම් ආයතන |
| **BC10** | වාහන බොඩි අලුත්වැඩියාවන් කිරීම / වාහන පින්තාරු කිරීම |
| **BC11** | වාහන අලුත්වැඩියාවන් හා සේවාවන් (යාන්ත්‍රික/විදුලි/වායු සමීකරණ) |
| **BC12** | පරිගණක හා උපාංග ආශ්‍රිත සේවා සැපයුම් |
| **BC13** | දුරකථන හා දත්ත පද්ධති ආශ්‍රිත සේවා සැපයුම් |

**1.0 යෝග්‍යතා නිර්ණායක**

A කාණ්ඩය - <u>ඉදිකිරීම් "වැඩ" සඳහා</u>

1.1 ගොඩනැගිලි ඉදිකිරීම් ක්ෂේත්‍රය පිළිබඳ ICTAD (වර්තමාන නාමය CIDA) හි වලංගු ලියා පදිංචියක් ලබා තිබිය යුතුය.

1.2 බස්නාහිර පළාත තුළ ව්‍යාපාර ලියා පදිංචි ලිපිනයක් තිබිය යුතුය.

1.3 අසාධු ලේඛන ගත නොවී සිටිය යුතු අතර, පසුගිය කාලය තුළ ඉටුකරන ලද ඉදිකිරීම් වල අදාල ප්‍රමිතීන් පවත්වාගෙන යාමට අපොහොසත් වීම් පිළිබඳ වාර්තා නොතිබිය යුතුය.

B කාණ්ඩය - **<u>සැපයුම්කරුවන්, උපදේශන සේවා සැපයුම්කරුවන්, සුළු පරිමාන කොන්ත්‍රාත්කරුවන් සඳහා</u>**

1.4 යාවත්කාලීන කරන ලද ව්‍යාපාර ලියාපදිංචිය තිබිය යුතුය.

1.5 අදාළ වෘත්තිකයන් හෝ ආයතන මඟින් ලබා ගත් නිර්දේශිත ලිපි දෙකක් ඉදිරිපත් කිරීමට හැකි විය යුතුය.

1.6 ගනුදෙනු කරුවන්ගේ ලැයිස්තුවක් සහ කාර්ය සාධන සහතික ඉදිරිපත් කල යුතුය.

1.7 ඊට අමතරව **BA** - කාණ්ඩය සඳහා අදාළ වෘත්තීයමය ආයතන වල සංගත සාමාජිකත්වය හෝ ලියාපදිංචිය සහිත පුද්ගලයන් හෝ ආයතන විය යුතුය (එනම්, ගෘහ නිර්මාණ ශිල්පී ආයතනය, ඉංජිනේරු ආයතනය, ප්‍රමාණ සමීක්ෂක ආයතන ආදී........)

**2.0** පොදු සුදුසුකම් හා නිර්ණායක

**2.1** එක් එක් කාණ්ඩ යටතේ ලියාපදිංචිය සඳහා සුදුසුකම් ලැබීමට, අයදුම්කරුවන් බස්නාහිර පළාතේ ස්ථිර පදිංචිකරුවෙකු විය යුතුය. නැතහොත් බස්නාහිර පළාත තුළ ව්‍යාපාර ලියාපදිංචි කිරීමක් තිබිය යුතුය. ව්‍යාපාර ලියාපදිංචි සහතිකයක් ඉදිරිපත් නොකරන අවස්ථාවන්හිදී ග්‍රාම නිලධාරි විසින් ස්ථිර පදිංචි ලිපිනය / ව්‍යාපාර ලිපිනය තහවුරු කරන සහතිකයක් ඉදිරිපත් කළ යුතුය.

**2.2** සියලුම අයදුම්කරුවන් අදාළ ක්ෂේත්‍රයේ අවම වශයෙන් අවුරුදු දෙකක (2) ක පළපුරුද්දක් ඇති අය විය යුතුය. සනාථ කරන ලියකියවිලි ඉදිරිපත් කළ යුතුය.

**2.3** අයදුම්පත පරීක්ෂා කිරීමෙන් පසු නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (ඉංජිනේරු) විසින් නම් කරන ලද කමිටුවක් විසින් ව්‍යාපාර පරිශ්‍රය පරීක්ෂා කිරීම / තක්සේරු කිරීමෙන් අනතුරුව ලියාපදිංචිය සිදු කරනු ඇත.

**2.4** අයදුම්පත් පිළිගැනීම හෝ ප්‍රතික්ෂේප කිරීමේ බලය නියෝජ්‍ය ප්‍රධාන ලේකම්(ඉංජිනේරු සේවා) සතුය.

**2.5** 2022.04.29 දින ප.ව. 2.00 ට පසුව ලැබෙන අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ.

මේ පිළිබඳ උනන්දුවක් දක්වන කොන්ත්‍රාත්කරුවන් හා සැපයුම්කරුවන්ට, අවශ්‍ය වැඩි දුර විස්තර හා ලේඛන පරීක්ෂා කර බැලීම 2022.03.28 දින සිට 2022.04.28 දින දක්වා සතියේ වැඩ කරන දින වල පැය 9.00 සිට 15.00 පැය දක්වා ඉංජිනේරු කාර්යාංශයේ ප්‍රසම්පාදන ඒකකයට පැමිණ පරීක්ෂා කිරීමට හෝ දුරකථන අංක 011- 2 092504 / 011-2 092506 ඇමතීමෙන් විමසීම් කළ හැක.

ලියාපදිංචි වීමට අපේක්ෂා කරන අයදුම්කරුවන් **බස්නාහිර පළාත් ඉංජිනේරු කාර්යාංශයයේ** ප්‍රධාන ගණකාධිකාරී වෙත එක් එක් කාණ්ඩ සඳහා ආපසු නොගෙවන රු:1500.00 බැගින් වූ ගාස්තු මුදලින් ගෙවා රිසිට් පත ඉදිරිපත් කිරීමෙන් 2022.03.28 වැනි දින සිට 2022.04.28 දින දක්වා ඕනෑම වැඩ කරන දිනයකදී පැය 9.00 හා 15.00 පැය අතර කාලය තුලදී අයදුම්පත් කට්ටල ලබා ගත හැකිය.

මුල් පිටපත හා අනු පිටපත වශයෙන් සම්පූර්ණ කරන ලද අයදුම්පත් සනාථ කිරීමේ ලිපි ලේඛණ සමඟ මුද්‍රා තබා, ලිපි කවරයක බහා වම්පස ඉහළ කෙලවරේ " ඉදිකිරීම් වැඩ සඳහා කොන්ත්‍රාත්කරුවන් සහ සැපයුම්කරුවන් ලියා පදිංචිය 2022/2023 " යනුවෙන් සඳහන් කර 2022.04.29 වැනි දින ප.ව.2.00 ට හෝ ඊට පෙර ලැබෙන සේ "නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (ඉංජිනේරු), **බස්නාහිර පළාත් ඉංජිනේරු කාර්යාංශය,** 5 වන මහල, පළාත් සභා ගොඩනැගිලි සංකීර්ණය, 204, **ඩෙන්සිල් කොබ්බෑකඩුව මාවත, බත්තරමුල්ල** " යන ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් හෝ අතින් ගෙනවිත් භාරදිය හැකිය.

නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (ඉංජිනේරු)
ඉංජිනේරු කාර්යාංශය (බ.ප),
5 වන මහල, අංක 204,
ඩෙන්සිල් කොබ්බෑකඩුව මාවත,
බත්තරමුල්ල.
දු.ක. - 011-2092504